**අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාරය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය නොකළ මතය

අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාරයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

භාරයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය භාරය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, භාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ භාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ භාරයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, භාරය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(ආ)** 2018 අංක 19 දරන ජාතික විගණන පනත 40 (1) ඡේදය | අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාරය අධිකරණ අමාත්‍යාංශය, ශීර්ෂය 110 යටතේ ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. එබැවින් එහි අභ්‍යන්තර විගණන කටයුතු අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් සිදු කල යුතු වේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 40 (1) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| **(අ)** 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.2(ආ) ඡේදය | භාරයේ අතිරික්ත මුදල් අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට පියවර ගතයුතු බව දක්වා ඇතත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.9,600,818 ක් භාරයේ බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2018.12.31 දින පැවැති අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාරයේ 04 වන කමිටු රැස්වීමේදී කල්මුනේ, මඩකලපුව, අම්පාර, පොළොන්නරුව, තංගල්ල, ගම්පහ, කෑගල්ල, ගාල්ල, සහ මොණරාගල යන මහාධිකරණ කලාප 09 සඳහා රු. 6,114,494,25 ක කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව ඒ සඳහා යන වියදම් දැරීමට ජංගම ගිණුමෙහි ඉතිරි ශේෂය රඳවා තබා ගෙන ඇත. | 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2(ආ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,530,408 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 6,035,148 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 11,565,556 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂය තුල යටිතල පහසුකම් නඩත්තු වියදම් රු. 12,140,658 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2007 ජූලි 17 දින භාරකාර ඔප්පුවක් මඟින් ස්ථාපිත කර තිබූ මෙම භාරයෙහි, භාරකාර ඔප්පුවේ 1(A) අනුව අධිකරණ නිල නිවාස, ලේඛන හා නඩු භාණ්ඩ කාමර, විනිශ්චයකාරවරුන්ගේ කාමර, රෙජිස්ට්‍රාර් කාර්යාල, නඩුකාරවරුන්ගේ පුස්තකාල යනාදිය නඩත්තු කිරීම, තොරතුරු තාක්ෂණය, ලී බඩු උපකරණ යනාදිය සඳහා අරමුදල් සැපයීම මෙම භාරයේ ප්‍රධාන අරමුණු හා කාර්යයන් විය. නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.<br><br>(අ) භාරය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.10,000,000 ක මුදලක් අධිකරණ අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ අතර, ස්ථාවර තැන්පත් පොළී ලැබීම් රු.60,874 ක් ද සමඟ මුළු අයභාරය රු.10,060,874 ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී රු.3,582,550 ක් වැය කර කොළඹ මහාධිකරණ කළාපය වෙත කාර්යාල උපකරණ මිලදී ගැනීම පමණක් සිදු කර තිබූ අතර, ඉහත ප්‍රධාන අරමුණු ඉටු වන පරිදි නඩත්තු කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුල කිසිඳු අධිකරණ කලාපයකින් නඩත්තු කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලීම් ඉදිරිපත් කර නොතිබුණු අතර ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණේ තොරතුරු තාක්ෂණ හා ලී බඩු උපකරණ සඳහා පමණි. ඒ අනුව කොළඹ මහාධිකරණ කලාපයට සපයන ලද කාර්යාල උපකරණ වලට අමතරව 2018.12.31 දින පැවැති භාරකාර මණ්ඩල රැස්වීමේදී, මහාධිකරණ කලාප 09 ක් සඳහා රු. 6,114,494.25 ක කාර්යාල උපකරණ සැපයීමට කටයුතු කර ඇත. | භාරකාර ඔප්පුවේ 1- (A) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන අරමුණු ඉටු වන පරිදි කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| (ආ) තවද සමාලෝචිත වර්ෂයේදී අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව අධිකරණ කළාපයන්හි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් කාර්ය සඳහා මූලධන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.120,000,000 ක් වෙන්කර තිබුණි. එම මුදලින් රු.105,735,865 ක් වැය කර ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදීගෙන තිබුණි. එම හේතුවෙන් එකී කාර්යය සඳහාම භාරය මඟින්ද රු. 3,582,550 ක් වැය කර තිබුණි. | අදහස් දක්වා නොමැත | එක් ආයතනයකින් වියදම් දැරීම කළ යුතු බව. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාරකාර ඔප්පුවේ 18 වගන්තිය ප්‍රකාරව භාරකාර මණ්ඩලය සෑම මාස දෙකකට වරක් රැස් වියයුතු වුවද සමාලෝචිත වර්ෂයේ රැස්වීම් 04 ක් පමණක් පවත්වා තිබුණි. | ඡේදයේ සඳහන් කරුණු සමඟ එකඟ වේ. | භාරකාර ඔප්පුවේ 18 වගන්තිය ප්‍රකාරව භාරකාර මණ්ඩලය සෑම මාස දෙකකට වරක් රැස් විය යුතු බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අරමුදලේ අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීම සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ලැබී නොතිබුණි. | ඡේදයේ සඳහන් කරුණු සමඟ එකඟ වේ. | ක්‍රියාකාරී සැලැස්ම සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය සමාලෝචිත වර්ෂය තුල ලබා ගත යුතු බව. |